GMOA

ESTABLISHED IN
1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

21-01-2014

## මාධ්‍ය නිවේදනය

### ව්‍යාජ වෛද්‍යවරු නිතිගත කිරීම

ශ්‍රී ලංකාවේ ව්‍යාජ වෛද්‍යවරුන් 40,000ක් පමණ ඇති බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය නිරන්තරයෙන් අවධාරණය කර ඇති අතර මෙය ගුණාත්මක සෞඛ්‍ය සේවයක් ජනතාවට ලබා දිමේදි දැඩි බධාවක් වි ඇත.

2009 වසරේදි සුදුසුකම් රහිත පුද්ගලයින් පිරිසකට ලියාපදිංචිය ලබා දීම නිසා හෝමියෝපති වෛද්‍ය සභාව විසුරුවා හැරීමට එවකට දේශිය වෛද්‍ය අමාත්‍ය ලෙස සිටි තිස්ස කරලියද්ද මහතා තිරණය කර නව හෝමියෝපති පණතක් ගෙන ඒම සඳහාත් පවතින පණත අවලංගු කිරීම සඳහාත්, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදි.

හෝමියෝපති ක්ෂෙත්‍රයේ පවතින ගැටලු විසඳීම සඳහා වන නව හෝමියෝපති පණත තිති ගත කරන ලෙස අගවිනිසුරු විසින් ද නියෝග කර ඇත. පවතින අධිකරණ කටයුතු අවසන් කරන තෙක් දේශිය වෛද්‍ය අමාත්‍යංශයේ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් පරිපාලන කටයුතු කරගෙන යන ලෙස නිතිපතිතුමාගෙන් ලද උපදෙස් අනුව අමාත්‍ය මණ්ඩලය මගින් අනුකමිටුවක් පත් කරන ලදි.

නමුත් නව දේශිය වෛද්‍ය අමාත්‍ය සාලින්ද දිසානායක මහතා අදාල අනු කමිටුව විසුරුවා හැර කිසිඳු රාජ්‍ය නිලධාරියෙක් නොමැති තමාට හිතවත් අත්දැකිම් රහිත පිරිසක් සමග නව කමිටුවක් පිහිටුවා ඇත. මෙම කමිටුව අදාල සම්මුඛ පරික්ෂණ රජයේ නිවාඩු දින වල පවත් වන බවත්, ලියාපදිංචිය ලබාදිම සඳහා මුදල් අය කරන බවත් සුදුසුකම් රහිත පුද්ගලයින් 38 දෙනෙකු පළමු කණ්ඩායම අද දින ලෙස මේ හරහා ලියාපදිංචිය ලබා ගන්නා බවත් අපට වාර්තා වී ඇත.

රටක සෞඛ්‍ය ක්ෂෙත්‍රය ඉතාමත්ම ඉහළ ප්‍රමිතියකින් පවත්වා ගෙන යා යුතු වුවද දේශිය වෛද්‍ය අමාත්‍යවරයා සිදු කරන මෙම ක්‍රියාදාමය තුල සමස්ථ සෞඛ්‍ය සේවාවේම ප්‍රමිතිය බරපතල තර්ජනයකට ලක් වි ඇත. මේ ආකාරයට නිත්‍යානුකුල නොවන කමිටුවක් මගින් ව්‍යාජ වෛද්‍යවරුන් නිත්‍යානුකුලභාවයට පත් කිරීමට ගන්නා උත්සාහය රජයේ වෛද්‍ය නිලධාන්ගේ සංගමය දැඩි ලෙස හෙලා දකින අතර මේ ආකාරයට ජනතා පිවිත අනතුරට පත් නොකරන ලෙස අදාල අමාත්‍යවරයාට බල කර සිටි.

මෙම සමස්ථ ක්‍රියාවලිය පිළිබඳ පුළුල් වාර්තාවක් ඉතාම ඉක්මනින් අතිගරු ජනාධිපතිතුමාට බාර දිමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ විධායක කමිටුව තිරණය කර ඇත.

ස්තුතියි,

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර -

| | |
|---|---|
| වෛද්‍ය නවීන් ද සොයිසා | - 0718582444 |
| වෛද්‍ය නලින්ද හේරත් | - 0717876516 |
| වෛද්‍ය නලින් ආරියරත්න | - 0714800942 |